JMC JAYASEKERA MANAGEMENT CENTRE
"Pioneers in Professional Education"

# වරලත් ගණකාධිකරණය – BL 01

## මූල්‍ය ගිණුම්කරණය

Rukkantha Wanniarachchige
Reading for MBA (PIM-SJP), BBA (Acct.) Hons., ACA


JMC vLearning
your virtual learning partner

# SLFRS 15
# ගනුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වලින් ඇතිවන අයභාරය
# (01-01-2018 සිට)


SLFRS 15
ගනුදෙනුකරුවන්
සමඟ ගිවිසුම්වලින්
ඇතිවන
අයභාරය
(01-01-2018 සිට)
Sandeepa Jayasekera - JMC
3


ඔයා
විකුණුම්කරු
කියලා හිතන්න!




JMC vLearning
"your virtual learning partner"

# DSI එක විකුණුම් ආදායම හඳුනාගන්න ඕනි කොයි වෙලේද?

**A**
සපත්තු තේරුවා 10.15 වෙද්දි

**B**
ඉන්වොයිස් එක දැම්මා 10.16 වෙද්දි

**C**
සල්ලි ගෙව්වා 10.17ට

**D**
සපත්තු ටික අතට හම්බවුණා 10.18ට






## DSI එක විකුණුම් ආදායම හඳුනාගන්න ඕනි කීයටද?

A
සපත්තු
තේරුවා
10.15 වෙද්දි

B
ඉන්වොයිස්
එක දැම්මා
10.16 වෙද්දි

C
සල්ලි ගෙව්වා
10.17ට


D
සපත්තු ටික
අතට
හම්බවුණා
10.18ට



JMC vLearning "your virtual learning partner"

# මාස 2ක් පුරාවට උගන්වනවා නම් ආදායම හඳුනාගන්න ඕනි කොයි වෙලේද?





JMC vLearning
"your virtual learning partner"


විකුණුම් නොවේ!
දේපළ පිරියත
උපකරණ
ඉවත්කිරීමකි!


අයභාරය නිර්වචනය
ව්‍යාපාරික
ආදායම
Sandeepa Jayasekera - JMC
14

# ආදායම හඳුනාගැනීම
## පියවර 05 ආකෘතිය








JMC vLearning "your virtual learning partner"

ගනුදෙනු

භාණ්ඩ සේවා

මිල

මිල භාණ්ඩ හා සේවා අතර බෙදීම

පාලනය මාරු වූ පසු ආදායම හඳුනා ගැනීම



JMC vLearning "your virtual learning partner"

# පියවර 01

# ගනුදෙනුකරු සමග ඇති ගිවිසුම් හඳුනාගැනීම

| | | | |
|---|---|---|---|
| ගිවිසුම හඳුනාගැනීමට සම්පූර්ණ විය යුතු නිර්ණායක | වාණිජමය හරය | ගිවිසුම නිසා අනාගත මුදල්, අවදානම් වෙනස්වීම | |
| | අනුමත වීම | ලිඛිතව<br>වාචිකව<br>ව්‍යංගයෙන් | |
| | පාර්ශවයන්ගේ අයිතීන් | විකුණුම්කරු<br>පාරිභෝගිකයා | මුදල්<br>භාණ්ඩ සේවා |
| | ගෙවීම් කොන්දේසි | ගෙවන වේලාව<br>වාරික<br>දඩ හෝ දිරිදීමනා | |
| | අය කරගැනීමේ හැකියාව | | |



JMC vLearning
"your virtual learning partner"

# පියවර 2

# පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාවන් හඳුනාගැනීම

## බැඳීම

- අදාළ භාණ්ඩය හෝ සේවාව පමණක් භාවිතා කිරීම තුලින් පාරිභෝගිකයා තෘප්තිමත් කළ හැකි ද?
- ගිවිසුමේ අනිකුත් බැඳීම් තුලින් වෙන් කර හඳුනාගත හැකි ද?

ඔව් → එකිනෙකට යැපෙන්නේ නැති → නිශ්චිත බැඳීමකි → වෙන වෙනම ගිණුම් තැබිය යුතුය


නැත → එකිනෙකට යැපෙන → සම්බන්ධිත බැඳීමකි → ඒකරාශී කර තනි බැඳීමක් ලෙස ගිණුම් තැබිය යුතුය




JMC vLearning
"your virtual learning partner"

## පියවර 3

# ගනුදෙනුවෙහි මිල තීරණය කිරීම








JMC vLearning
"your virtual learning partner"

# පියවර 4

# ගනුදෙනුවෙහි මිල කාර්යසාධන බැඳීම්වලට බෙදු වෙන් කිරීම




JMC vLearning
“your virtual learning partner”




# තනි විකුණුම් මිල යනු

- භාණ්ඩය හෝ සේවාව
- වෙන වෙනම විකුණන්නේ නම්
- අය කරන මිල




JMC vLearning "your virtual learning partner"

# ගැලපුම් කරන ලද වෙළඳපල තක්සේරු ප්‍රවේශය

තරඟකරුවන්ගේ මිල + පිරිවැය ගැලපුම් + පළපුරුද්ද ආශ්‍රිත ගැලපුම් = ගලපන ලද වෙළඳපොළ මිල

# අපේක්ෂිත පිරිවැයට ආන්තිකයක් එකතු කල ප්‍රවේශය






JMC vLearning "your virtual learning partner"

# අවශේෂ ප්‍රවේශය

(මෙය භාවිතා කළ හැකි වන්නේ සීමිත අවස්ථාවන් වලදී පමණි)

සමස්ත විකුණුම් මිල

− තනි විකිණුම් මිල

− ගලපන ලද විකුණුම් මිල

− පිරිවැය මත ලාභාන්තිකයක් එකතු කළ මිල

= අවශේෂ මිල

## පියවර 5

# කාර්යසාධන බැඳීම තෘප්තිමත් වූ පසු අයභාරය හඳුනා ගැනීම



## ආදායම හඳුනාගත යුත්තේ කුමන අවස්ථාවේද?

විකුණුම්කරු → භාණ්ඩ/සේවා පාලනය මාරු වන අවස්ථාවේදී → පාරිභෝගිකයා

- නිශ්චිත මොහොතක
- කාලයක් පුරාවට



JMC vLearning "your virtual learning partner"

## පාලනය

- ආර්ථික ප්‍රතිලාභ
  - 100% පාහේ භුක්ති විඳී
  - අන් අය භුක්ති විඳීම වළකයි
- වත්කමේ භාවිතය
  - තීරණය කරයි
  - අන් අය භාවිතා කිරීම වළකයි



| | | |
|---|---|---|
| පාලනය මාරු වීම | නිශ්චිත මොහොතක | භෞතික සන්තකය මාරු වීම |
| | | පාරිභෝගිකයා වත්කම පිළිගෙන තිබීම |
| | | අවදානම් සහ ප්‍රතිලාභ මාරු වීම |
| | | නෛතික අයිතිය මාරු වීම |
| | කාලයක් පුරාවට | භාණ්ඩ/සේවා ලබා දීම සහ පරිභෝජනය එකවර සිදුවීම |
| | | වත්කම පාරිභෝගිකයාගේ පාලනය තුල පැවතීම |
| | | විකල්ප භාවිත නොමැති වීම සහ ගෙවීම් ලබාගැනීමට අයිතියක් පැවතීම |



JMC vLearning “your virtual learning partner”

# ප්‍රශ්න 01

- DSI සමාගම පාසල් පාවහන් විකිණීමේ නියැලී සිටී 2020/10/31 වන දින DSI සමාගම විසින් රු. 1,500 ක් වටිනා පාසල් පාවහන් යුගලයක් විකුණන ලදී.
- මෙම ගනුදෙනුවට අදාළ කාර්යසාධන බැඳීම සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිළි කරන්න.



# ප්‍රශ්න 01

| | |
|---|---|
| කාර්යසාධන බැඳීම් | |
| මිල | |
| අයභාරය හඳුනාගැනීම | |



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 02

- ගුරුවරයෙකු සිය දේශණයක් සඳහා පැය දෙකක කාලයකට රු 10,000ක් අය කරයි
- එම දේශණයට අමතරව නිබන්ධනයක් ලබා දේ
- එම ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න

.



JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න 02

| කාර්යසාධන බැදීම් | |
|---|---|
| මිල | |
| අයභාරය හදුනා ගැනීම. | |

# ප්‍රශ්න 03

අමල් සමාගම වායුසමීකරණ යන්ත්‍ර විකිණීමේ නිරතව සිටී. 2021/01/01 වන දින රු 500,000/-ක් වටිනා වායුසමීකරණ යන්ත්‍රයක් විකුණන ලද අතර, එය ස්ථාපනය කර දීමට ද අතිරේකව එකඟවිය. ඒ සඳහා රු 10,000/-ක් අය කරන ලදි.

- ඉහත ගනුදෙනුවට අදාළව කාර්යසාධන බැඳීම් හඳුනාගන්න
- එම බැඳීම් නිශ්චිත බැඳීම් ද සම්බන්ධිත බැඳීම් ද යන්න පැහැදිලි කරන්න

.



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 03

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |

# ප්‍රශ්න 04

වසන්ත සමාගම පරිගණක විකිණීමේ නියැළී සිටී. 2020/03/01 දින පරිගණක අලෙවි ගනුදෙනුවකට එළැඹී අතර ඒ අනුව රු 1,000,000/- වටිනා පරිගණක දෘඩාංග විකිණීමටත්, රු 400,000ක වටිනාකමින් යුතු මෙහෙයුම් මෘදුකාංගයන් පරිගණක වෙත ස්ථාපනය කිරීමටත්, රු 100,000/-ක් අය කර වසරක් නඩත්තු කරදීමටත් එකඟ විය.

- ඉහත ගනුදෙනුවට අදාළව කාර්යසාධන බැඳීම් හඳුනාගන්න
- එම බැඳීම් නිශ්චිත බැඳීම් ද සම්බන්ධිත බැඳීම් ද යන්න පැහැදිලි කරන්න
- මෙම ආදායම් හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න



# ප්‍රශ්න 04

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 05

My Pc ආයතනය පරිගණක අලෙවියේ නියැලී සිටී. දමිත් විසින් තම ව්‍යාපාරය සඳහා පරිගණක 10 ක් මිලදී ගැනීම සඳහා My Pc ආයතනය සමඟ ගිවිසුමකට එළඹියේය.
එම ගිවිසුමට අනුව My Pc ආයතනය විසින් වසරක නඩත්තු කාලයක් සඳහා එකඟ විය.
එක් පරිගණකයක් රු. 100,000 ක් වූ අතර නඩත්තු කාලයේ වටිනාකම රු. 250,000 ක් ද වේ. එක්වර පරිගණක 10 ක් මිලදී ගත් බැවින් සමස්ත ගනුදෙනුව සඳහාම රු. 200,000ක වට්ටමක් ලබා දෙන ලදී.

- ඉහත ගනුදෙනුවට අදාළව කාර්ය සාධන බැඳීම් හඳුනාගන්න
- නිශ්චිත බැඳීම් සහ සම්බන්ධිත බැඳීම් වෙන් කරගන්න
- ඒ ඒ බැඳීම් සඳහා වටිනාකම් ගණනය කරන්න
- ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න



# ප්‍රශ්න 05

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම | | | |
| සම්බන්ධිත බැඳීම | | | |



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 06

OIT සමාගම මෘදුකාංග නිෂ්පාදනය හා අලෙවියේ නියුක්ත සමාගමකි. ඔවුන් විසින් ගිණුම්කරණ මෘදුකාංගයක් නිර්මාණය කළ අතර මෙම මෘදුකාංගය අලෙවිය සඳහා රු. 1,000,000 ක් ද වසරක සේවා කාලය සඳහා රු.500,000 ක් ද අය කරයි. අලෙවිය සහ සේවා කාලය යන දෙකම ලබාගන්නේ නම් රු.1,200,000 ක් අය කෙරේ.

- සමන් විසින් මෘදුකාංගය සහ අලෙවියෙන් පසු සේවාව යන දෙකම ලබා ගන්නා ලදී. මෙම ගණුදෙණුවට අදාල කාර්යසාධන බැඳීම්, ඒ ඒ බැඳීමේ වටිනාකම සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න.



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 06

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |

# ප්‍රශ්ණ 07

JMC ආයතනය අධ්‍යාපන සේවා ලබාදීමේ නිරත වී සිටී. පහත පාඨමාලාවන් සඳහා කාර්යසාධන බැඳීම්, කාර්යසාධන බැඳීම් වල මිල ගණන් සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න.

<u>ව්‍යාපාරික ඉංග්‍රීසි පාඨමාලාව</u>

පාඨමාලා කාලය මාස 04 ක් වන අතර සමස්ත අය කිරීම රු. 15,000 ක් වේ. පාඨමාලාව තුල දේශන දායකත්වය, ශාලා පහසුකම්, රු. 1,000 ක් වෙළඳපොල මිල වන නිබන්දනය, එක් දින ප්‍රායෝගික පුහුණු වැඩමුළුව, ක්ෂේත්‍ර චාරිකාව යනාදිය ඇතුලත් වේ. එක්දින ප්‍රායෝගික වැඩමුළුව සහ ක්ෂේත්‍ර චාරිකාවට පමණක් සම්බන්ධ වන්නේ නම් රු. 3,000 ක් හා රු. 4,000 ක් අය කෙරේ

<u>වරලත් ගණකාධිකරණ පාඨමාලාව</u>

මාසික පාඨමාලා ගාස්තුව රු. 2,500 ක් වන අතර සමස්ත පාඨමාලා කාලය මාස 06 ක් වේ. පාඨමාලා කාලය තුල දේශන දායකත්වය, ශාලා පහසුකම් සහ නිබන්දන ලබා දීමට JMC ආයතනය කටයුතු කරයි. නිබන්දන කට්ටලය සඳහා රු. 2,000 ක පිරිවැයක් වැය වන අතර JMC ආයතනය පිරිවැය මත 15% ක ලාභ ප්‍රතිශතයක් අපේක්ෂා කරයි.



# ප්‍රශ්න 07

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |

# ප්‍රශ්න 08

නාමල් සමාගම මෘදුකාංග නිර්මාණයේ නියැලී සිටී. චතුර සමාගම විසින් සිය ආයතනයේ වැටුප් පිළියෙල කිරීම සඳහා මෘදුකාංගයක් තැනීමට නාමල් සමාගම සමඟ ගිවිසුමකට එළඹන ලදී. එම ගිවිසුමට අනුව මෘදුකාංගය නිර්මාණය කිරීම, දෘඩාංග මිලදී ගැනීම, සේවකයන් පුහුණු කිරීම සහ වසරක සේවා කාලයක් ලබා දීමට නාමල් සමාගම එකඟ විය.

සමස්ත මෘදුකාංග ගිවිසුමේ වටිනාකම රු. 1,000,000 ක් විය. නාමල් සමාගම මෙම සේවාවන් වෙන වෙනම ලබා දෙන්නේ නම් වෙළඳපොල මිල ගණන් පහත පරිදි වේ.

.



# ප්‍රශ්න 08

| | |
|---|---|
| මෘදුකාංගය නිර්මාණය කිරීම | 400,000 |
| දෘඩාංග මිලදී ගැනීම | 400,000 |
| සේවකයන් පුහුණු කිරීම | 100,000 |
| සේවා කාලය වසරක් සඳහා | 100,000 |

මෙම සමාගම 2021/01/01 දින මෘදුකාංගය නිර්මාණය කිරීම ආරම්භ කරන ලද අතර එය 2021/03/01 දින වන විට අවසන් විය. 2021/03/05 වන දින දෘඩාංග මිලදී ගත් අතර මෘදුකාංග ඇතුලත් කරන ලද දෘඩාංගයක් 2021/03/15 වන දින චතුර සමාගමේ කාර්යාලය තුල ස්ථාපනය කරන ලදී. එදින සිට පුරා සතියක් සේවකයන් පුහුණු කළ අතර 2021/03/22 සිට 2022/03/22 තෙක් වසරක කාලය සඳහා සේවා පහසුකම් ලබා දීමට එකඟ වන ලදී කාර්යසාධන බැඳීම්, කාර්යසාධන බැඳීම් වල මිල ගණන් සහ ආදායම හඳුනාගත යුතු ආකාරය පැහැදිලි කරන්න.



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න 08

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |



JMC vLearning
"your virtual learning partner"

# ප්‍රශ්න 09

| බැඳීම් | කාර්යසාධන බැඳීම් | මිල | අයභාරය හඳුනාගැනීම |
|---|---|---|---|
| නිශ්චිත බැඳීම් | | | |
| සම්බන්ධිත බැඳීම් | | | |

# ඉදිරිපත් කිරීම

- ලාභලාභ ගිණුම
  - අයභාරය
- මූල්‍ය තත්ව ප්‍රකාශය
  - ජංගම වත්කම්
    - පාරිභෝගිකයාගෙන් ලැබිය යුතු ශේෂය
  - ජංගම වගකීම්
    - පාරිභෝගිකයාගෙන් ලද අත්තිකාරම්



JMC vLearning "your virtual learning partner"

# හෙළිදරව් කිරීම්

- ගිවිසුම් වත්කම් සහ ගිවිසුම් වගකීම්
  - ආරම්භක ශේෂ
  - අවසාන ශේෂ
  - බැඳීම් පිළිබඳ තොරතුරු
- අයභාරය
  - විවිධ වර්ග වලින් ජනනය වූ අයභාරය
- විනිශ්චයන්
  - විනිශ්චයන්ගේ වෙනස්වීම්
  - මිල බෙදා වෙන් කිරීම
  - අයභාරය හඳුනාගන්නා අවස්ථාව